# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 දෙසැම්බර්

**මානවශාස්ත්‍ර පීඨය**

**නාට්‍ය හා රංගකලාව** (නව/පැරණි නිර්දේශය)

**නාට්‍ය නිර්මාණය හා විචාරය DMAT – E 3025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. පිටපතක් නාට්‍යයක් බවට පත්වීමේ ක්‍රියාවලියේ මූලික අවස්ථා විස්තර කොට නිර්මාණ කාර්යයේ දී එකී අවස්ථාවල දී අධ්‍යක්ෂවරයා මුහුණ දෙන අභියෝග කවරේදැයි පහදන්න.

02. 'පිටපතක ඇති චරිත ජීවමාන කිරීම සඳහා උචිත නළුවරණය (Casting) අධ්‍යක්ෂවරයා මුහුණ දෙන සංකීර්ණ අභියෝගයකි' නිදසුන් සහිතව විස්තර කරන්න.

03. රූපණය යනු කුමක්දැයි නිර්වචනය කොට ස්ටැනිස්ලව්ස්කිගේ න්‍යායාත්මක රූපණය (Method Acting) සහ බර්ටොල් බ්‍රෙෂ්ට්ගේ එපික් රංගය (Epic) අතර වෙනස්කම් විග්‍රහ කරන්න.

04. නර්තනය හා නාට්‍ය රංග වින්‍යාසය (Theatre Choreography) දෙකෙහි වෙනස පැහැදිලි කොට නාට්‍යයක රංග වින්‍යාසය නිර්මාණයෙහිලා සැලකිලිමත් විය යුතු කරුණු හා මුහුණ දෙන අභියෝග පැහැදිලි කරන්න.

05. කතාව හා කථාවින්‍යාසයෙහි වෙනස පැහැදිලිකොට නාට්‍ය රචනයේ දී භරත මුනි හා ඇරිස්ටෝටල් අවධාරණය කරන මූලිකාංග කවරේදැයි පහදන්න.

06. වේදිකා නාට්‍ය නිෂ්පාදන ක්‍රියාවලියේ දී වේදිකා කළමනාකරුවකු සතු කාර්යභාරය පැහැදිලි කරන්න

07. "වේදිකා නාට්‍යයක පසුතල නිර්මාණ අවශ්‍ය වන්නේ අලංකාරය සඳහා ද නාට්‍ය අර්ථකථනය සඳහා ද?" නාට්‍යමය උදාහරණ සහිතව විග්‍රහ කරන්න.

08. රංගාලෝක උපකරණ සහ ඒවායෙහි උපයෝගීතාවය සැකෙවින් විස්තර කර නාට්‍ය අර්ථකථනය උදෙසා රංගාලෝකකරණයේ දායකත්වය නාට්‍යමය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

09. සෞන්දර්යාත්මක ආකල්ප සහ සෞන්දර්යාත්මක නොවන ආකල්ප නාට්‍ය රසවින්දනයට සිදුකරනු ලබන බලපෑම නිදසුන් සහිතව විස්තර කරන්න.

10. රංගවස්ත්‍රාභරණ නිර්මාණකරණයේ දී ද්‍රව්‍ය වර්ණ සහ ආලෝක වර්ණ කෙරෙහි සැලකිලිමත්වීමේ අවශ්‍යතාවය නාට්‍ය උදාහරණයට ගනිමින් පැහැදිලි කරන්න.

************************************